# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.11 පැය 1905 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/711/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - අළුත්ගම පොලිස් වසම.

2025.04.11 වන අද දින උදෑසන කාලයේ අළුත්ගම පොලිස් වසමේ කුරුඳුවත්ත, දගර්‍ා නගරය ප්‍රදේශයේදී කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදී ඇති බවට අළුත්ගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත. පහරකෑමෙන් තුවාල ලැබූ කාන්තාව සීනවත්ත රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ කුරුඳුවත්ත, දගර්‍ා නගරය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරියගේ ස්වාමිපුරුෂයා විසින් ලේ තැවරුණු තියුණු ආයුධයද සමඟින් පොලිස් ස්ථානයට පැමිණ භාර වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත. පවුල් ආරවුලක් දුරදිග යාම හේතුවෙන් මරණකාරියගේ ස්වාමිපුරුෂයා විසින් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

**සැකකරු වයස අවුරුදු 45 ක් වන කුරුඳුවත්ත, දගර්‍ා නගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අළුත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.04.11 වන අද දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ රාවතාවත්ත පාලම අසලදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 200 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**